ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
පළමු වසර, දෙවන වසර සහ තුන්වන වසර දෙවන සාමාසික විභාග පැවැත්වීම
2027 ජනවාරි / පෙබරවාරි

විභාග අයදුම් කිරීම සඳහා පොදු උපදෙස්

- ඉහත උපාධි පාඨමාලාවේ පළමු වසර, දෙවන වසර සහ තුන්වන වසර දෙවන සාමාසික විභාග 2027 වර්ෂයේ ජනවාරි/පෙබරවාරි මස සිට සති අන්ත සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි දී සියලුම අධ්‍යයන මධ්‍යස්ථාන වල දී පැවැත්වේ.

- Intake VII (2019), Intake VIII (2020) සහ Intake IX (2021) යන කණ්ඩායම්වල ලියාපදිංචිවී සාමාසික හයටම (06) මුදල් ගෙවා ලියාපදිංචි වූ සිසුන් පමණක් රුපියල් 1500.00 ක මුදලක් ගෙවා 2026 වර්ෂයට ලියාපදිංචි වී පුනර් විභාග විෂයන් සඳහා අයදුම් කල යුතුය.

- Intake VII (2019) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන්ගේ අවසන් වර්ෂය මෙය වන අතර නැවත VII (2019) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන්ට පළමු වසර, දෙවන වසර සහ තුන්වන වසර දෙවන සාමාසික විභාගයකට අයදුම්කල නොහැකි අතර විභාගයට පෙනී සිටීම අනිවාර්යවේ.

- Intake VII (2019) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන් හතර වතාවකට (04) වඩා පළමු වසර සහ දෙවන වසර පළමු සාමාසික විභාගයට පෙනී සිට ඇත්නම්, විභාග අයදුම් පත්‍රය සමඟ විශේෂ විභාග අයදුම්පත්‍රය පුරවා සනාතන සභාවෙන් අවසර ලබාගත යුතුය. එසේ නොකර හතර වතාවකට (04) වඩා විභාගයට පෙනී සිට ඇත්නම් අවසන් වරට පෙනීසිටි විභාගයේ විභාග ප්‍රතිඵල අත්හිටවීමට විශ්වවිද්‍යාලයට බලය ඇති බව ඔබට දැනුම් දෙමි. (විශේෂ විභාග අයදුම්පත්‍රය https://fms.rjt.ac.lk/wp-content/uploads/2023/06/Grace-Chance-Application.pdf ලබාගත හැක)

- Intake VIII (2020) කණ්ඩායමේ ලියාපදිංචි සිසුන් හතර වතාවකට (04) වඩා පළමු වසර පළමු සාමාසික විභාගයට පෙනී සිට ඇත්නම්, විභාග අයදුම් පත්‍රය සමඟ විශේෂ විභාග අයදුම්පත්‍රය පුරවා සනාතන සභාවෙන් අවසර ලබාගත යුතුය. එසේ නොකර හතර වතාවකට (04) වඩා විභාගයට පෙනී සිට ඇත්නම් අවසන් වරට පෙනීසිටි විභාගයේ විභාග ප්‍රතිඵල අත්හිටවීමට විශ්වවිද්‍යාලයට බලය ඇති බව ඔබට දැනුම් දෙමි. (විශේෂ විභාග අයදුම්පත්‍රය https://fms.rjt.ac.lk/wp-content/uploads/2023/06/Grace-Chance-Application.pdf ලබාගත හැක)

- ඔබ පෙනී නොසිටි ඕනෑම විෂයක් නැවත අයදුම් කිරීමේ දී (පුනර් හෝ වෛද්‍ය) රුපියල් 1200.00 ක මුදලක් ගෙවිය යුතුය. (ඔබ විභාගයට පෙනී නොසිට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් රුපියල් 1000.00 මුදලක් අයදුම්පත් ගාස්තු ලෙස ගෙවා නියමිත අයදුම් පත්‍රය පුරවා පෙනී නොසිටි විෂය පැවැත්වූ දින සිට දින 14 ක් ඇතුලත දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයට ඔබගේ වෛද්‍ය සහතිකය ලැබී තිබිය යුතුය.)

  විභාග අයදුම් පත්‍රය, උපදෙස් පත්‍රිකාව සහ මුදල් ගෙවන වවුචර් පත https://cdce.rjt.ac.lk/ යන ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය වෙබ් අඩවියෙන් බාගත (Download) කරගත හැකිය.

- විභාග අයදුම්පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර 2026 නොවැම්බර් මස 12 වන දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ ගෙනවිත් බාර දිය යුතුය.

- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත් සඳහා පමණක් විභාග අයදුම්පත්‍රය ඔබගේ විද්‍යුත් ලිපිනයට (email) එවනු ලැබේ.

- විභාග අයදුම් පත්‍රය යොමු කරන කවරයේ වම්පස ඉහල කෙලවරේ "2026 BBA විභාග අයදුම් පත්‍රය " ලෙස සඳහන් කල යුතුය.

- ඔබ අයදුම් කල විභාග මධ්‍යස්ථානයට පමණක් විභාගය සඳහා පැමිණිය යුතුය. වැරදි විභාග මධ්‍යස්ථානයක් විභාග අයදුම්පතේ සඳහන් වී ඇත්නම් විභාගයට දින 07කට පෙර පහත දුරකථන අංකයට හෝ විද්‍යුත් ලිපිනය මඟින් අප වෙත දන්වා විභාග අයදුම්පත්‍රය නිවැරදි කරවා ගත යුතුය.

- විභාගය ආරම්භවීමට විනාඩි 30 කට ප්‍රථම තමාගේ විභාග මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතු අතර විභාගය ආරම්භ වී විනාඩි 30 ක් ගත වූ පසු ඔබට විභාග ශාලාවට ඇතුලු වීමට අවසර නොදේ.

- විභාග අයදුම්පත්‍රයක් නොමැති හෝ වැරදි විභාග මධ්‍යස්ථානයකට පැමිණෙන කිසිදු විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

- විභාගය සඳහා පෙනී සිටින සෑම මෙහොතකම විභාග අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කර ඇති ශිෂ්‍ය හැඳුනුම්පත සහ ජාතික හැඳුනුම්පත විභාග අයදුම්කරු සතුව තිබිය යුතුය.

- ඔබ විශේෂ අවශ්‍යතා ඇති විභාග අයදුම් කරුවෙකු නම් විභාගය ආරම්භ වීමට ප්‍රථම විභාග ශාලාධිපතිට ඒ බව දැනුම් දෙන්න.

- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මඟින් විභාග නීති රීති උල්ලංඝනය කරන සිසුන් සඳහා දැඩි දඩුවම් ලබා දෙන බැවින් සියලුම සිසුන් විභාග නීති රීති උල්ලංඝනය නොකරන ලෙස දන්වමි.

- විභාග අයදුම්පත් යොමුකල යුතු ලිපිනය

  සහකාර ලේඛකාධිකාරී
  ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
  දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය
  ඛුලන්කුලම දිසා මාවත
  දෙවන පියවර
  අනුරාධපුර

- විමසීම් - 025 2260220 exam@cdce.rjt.ac.lk

සහකාර ලේඛකාධිකාරී
ව්‍යාපාර පරිපාලනවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය